Suren D. Perera

**LL.M (Human Rights) Hong Kong, MA (Korea)**

Attorney-at-Law

**Office**
281, Deans Road,
Colombo 10.

**Tel** : 077-2996361
**Email:** suren.perera5@gmail.com


ලි.ප.තැ. 2022.05.21

**එන්තරවාසියයි**

පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

පොලිස්පතිතුමනි,

**2019.04.21 දින සිදු වූ පාස්කු ප්‍රහාරය සිදු වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය වළක්වා ගැනීමට ක්‍රියා නොකිරීම සම්බන්දයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩගමගේ නිලන්ත ජයවර්ධන මහතාව අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලා ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සදහා පියවර නොගැනීම.**

මගේ සේවාදායකයා වන 281, ඩීන්ස් පාර, කොළඹ 10 යන ලිපිනයෙහි 'සමාජය හා සාමයික කේන්ද්‍රය' යන නමින් කාර්යාලය පිහිටා ඇති එහි අධ්‍යක්ෂක වන රොහාන් සිල්වා පියතුමා යන අයගේ උපදෙස් මත මෙම ලිපිය ඔබ වෙත එවා සිටිමි.

මගේ සේවාදායකයාගේ උපදෙස් අනුව ඔහු විසින් 2022.04.20 වන දින පොලිස්පතිතුමා වෙත CR/555/22 යන අංකය යටතේ සහ පොලිස් සහන මැදිරියට CIB III 294/22 යන අංකය යටතේ ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්දයෙන් විමර්ශනය කොට අදාළ නිළධාරියාව අත්අඩංගුවට ගැනීමක් මේ වන තෙක් සිදු කර නොමැත.

මගේ සේවාදායකයාගේ උපදෙස් අනුව කියා සිටින්නේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද මෙම පැමිණිල්ලට අදාළ වරද සිදු කිරීම හේතුකොට ගෙන 2019 අප්‍රේල් 21 දින පාස්කු ප්‍රහාරය සිදු වී ඇති අතර ඒ හේතුවෙන් පුද්ගලයින් 267 ක් පමණ මියගොස් 400කට අධික ප්‍රමාණයක් තුවාල ලබා ඇත. එබැවින් මෙය මුළු මහත් ශ්‍රී ලංකාවම කම්පනයට පත් කරන ලද විශාල ජාත්‍යන්තර අවධානයකට ද ලක්වන ලද සිදුවීමකට අදාල පැමිණිල්ලකි. එමෙන්ම මෙම පැමිණිල්ල සමග අදාළ නිලධාරියාගේ වරදකාරිත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සාක්ෂි ආඥා පනත ප්‍රකාරව සාක්ෂි ලෙස පිළිගනු ලබන ලේඛන රැසක් ද ඉදිරිපත් කර ඇති බැවින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිදු වන කවර හෝ ප්‍රමාදයක් සාධාරණ නොවන බව මාගේ සේවාදායකයාගේ හැඟීමයි.

එබැවින් මෙයින් දන්වා සිටින්නේ මාගේ සේවාදායක විසින් ඉහත කී ලෙස පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල විභාග කර මෙකී අපරාධය සම්බන්දව අදාළ සැකකරුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසයි.

මාගේ සේවාදායකගේ උපදෙස් පරිදි මෙම එන්තරවාසිය ලැබී දින 14ක් ඇතුලත දී (රජයේ නිවාඩු දින හැර) ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතු නොකරන්නේ නම් ඔබට එරෙහිව නීතිමය පියවර ගැනීමට සිදුවන බව මෙයින් දන්වා සිටිමි.

මෙයට,

.................................

සේවාදායකගේ නීතිඥ

**Suren D. Perera**
LL.M (Human Rights) (Hong Kong),
MA (S. Korea)
Attorney-at-Law (Reg. No. 20268)
Commissioner for Oaths
281, Deans Road,
Colombo 10, Sri Lanka.
0772996361